ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම

අවසාන පරීක්ෂණය – 2007

**පරිසර නීතිය – LWU 3314**

කාලය - පැය තුනයි

ශ. 198

---

දිනය 2007 මාර්තු මස 22 වන දින  වේලාව පෙ ව 1.30 ප ව 4.30 දක්වා

---

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. "හුදෙක් නීතිදු දීම පමණක් නොව නිර්මාණය කිරීම ද විනිසුරුවරුන්ගේ කාර්යය වේ. එම නිසා පරිසර නීතිය සංවර්ධනය කිරීමේ දී සංවර්ධනයට ඇති අයිතිය සහ පරිසරය ආරක්ෂා කිරීම ඇතුලුව මානව අයිතිවාසිකම් තුළ සමතුලිත බවක් තබා ගැනීම සිත්හි තබාගෙන අධිකරණය විසින් ක්‍රියාකාරී ප්‍රවේශයක් අනුගමනය කළ යුතුය".

   (2002 අගෝස්තු මාසයේ දී තිරසාර සංවර්ධනය හා නීතියේ කාර්ය භාරය පිළිබඳ ලෝක විනිසුරුවන්ගේ ශාස්ත්‍රිය සම්මන්ත්‍රණයේ දී ඉන්දියාවේ හිටපු අග විනිසුරු භගවති වි. විසින් කරන ලද කථාව)

   සාර්ක් කලාපයේ අධිකරණ විසින් මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා කොතෙක් දුරට උත්සාහ දරා ඇත් ද යන්න පැහැදිලි කරමින් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුරෙහි ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටවල නඩු තීරණ සඳහන් කළ යුතු වේ.

2. පරිසර කළමණාකරණය සම්බන්ධයෙන් මහජන සහභාගීත්වය ශ්‍රී ලංකාව තුළ අසාර්ථක වී ඇති බව ඔප්පු වී ඇත.

   එවැනි සහභාගීත්වයක් සඳහා ප්‍රතිපාදන සලසන නීති හා රෙගුලාසි ඇසුරෙන් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

3. යක්විල යනුවෙන් හඳුන්වනු ලබන ස්වභාවික ජල පද්ධතියට සැතපුම් එකහමාරක් ඇතුලත ජාත්‍යන්තර ගුවන් තොටුපලක සෑදීමට සේලාන් රජය තීරණය කර ඇත. යක්විල කුරුළු පරාදීසයක් වශයෙන් ලෝක ප්‍රකට වේ. යක්විල වූකලී දිනකට සංචාරකයන් 1000 ක් පමණ පැමිණෙන ජනප්‍රිය සංචාරක ස්ථානයකි.

   සෙලාන්හි සියලු නීති රෙගුලාසි හා නඩු තීරණ ලංකාවේ නීති රෙගුලාසි හා නඩු තීරණවලට සමාන වේ. කෙසේ වුව ද පරිසර පණත යටතේ කලින් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නියමිත ව්‍යාපෘති ලැයිස්තුවෙන් ගුවන් තොටුපලවල් ඉවත් කිරීමට සේලාන්හි පරිසර ඇමතිවරයා මෑතක දී කටයුතු කර ඇත.

   මිත්රන් හා මුත්තයියා ගුවන් තොටුපල ඉදි කිරීම අභියෝගයට ලක් කිරීමට අදහස් කරති. එසේ කිරීමට ඔවුනට හැකිවන යම් නෛතික පදනමක් තිබේදැ යි ඔවුනට උපදෙස් දෙන්න. ඔවුන් විසින්

පහත සඳහන් අමතර කරුණු ඔබට සපයා දී ඇත.

(අ) රම්සාර් සම්මුතිය යටතේ යක්විල තෙත් බිමක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.
(ආ) එය වඳවීමේ තර්ජනයට මුහුණ පා සිටින සංක්‍රමණික කුරුලු වර්ග කිහිපයකට වාසස්ථානයකි.
(ඇ) ලෝක උරුමයන් පිළිබඳ සම්මුතිය යටතේ එය ස්වාභාවික උරුමයක් ලෙස නම් කිරීමට ශ්‍රී ලංකා රජය යෝජනා කර තිබුන ද පසුව එම යෝජනාව ඉවත් කර ගන්නා ලදි.
(ඈ) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මෑතක දී ගුවන් තොටුපළ වැඩ බිමට ආසන්නයෙන් පැරණි දාගැබක නටබුන් සොයාගෙන ඇති අතර ප්‍රදේශය තුළ විශාල නටබුන් සංකීර්ණයක් තිබෙන බව එම දෙපාර්තමේන්තුව විශ්වාස කරයි.

4. සිමාසහිත අලියා උලු නිෂ්පාදන සමාගම විසින් මැටිගම නම් ග්‍රාමයේ උලු නිෂ්පාදන කම්හලක් ආරම්භ කරන ලදි. ආසන්න ප්‍රදේශයෙන් මැටි ලබා ගත හැකි හෙයින් එවැනි කර්මාන්තශාලා කිහිපයක් මෙම ගම්මානය තුළ පිහිටුවා ඇත. අලියා උලු සමාගම ප්‍රාදේශීය සභාවෙන් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත් අතර කර්මාන්ත ශාලාව ඉදි කිරීමේ දී අදාල කළ යුතු ලෙස බලපත්‍රයේ සඳහන් වූ කොන්දේසි කිහිපයකට අනුව කටයුතු කළේය. මෙයට අමතරව අලියා උලු සමාගම විසින් මැටිගමින් සේවකයන් 100 කට අධික ප්‍රමාණයක් සේවයට බඳවා ගන්නා ලදි.

කර්මාන්තශාලාව ඉදි කර මාස හයකට පමණ පසුව කර්මාන්තශාලාවේ දුම් කවුලුවලින් පිටවන දුම තමනට අහිතකර ලෙස බලපාන බව අසල්වැසි නිවාස කිහිපයක පදිංචිකරුවන් විසින් පැමිණිලි කරන ලදි. මෙයට අමතරව කර්මාන්ත ශාලාව ආසන්නයේ මෑතක දී පෙර පාසලක් ද පිහිටුවා ඇත. මෙම පැමිණිලි හේතුකොටගෙන ප්‍රාදේශීය සභාව විසින් පරිසර ආරක්ෂණ බලපත්‍රය අත්හිටුවා අලියා සමාගම විසින් දුම් කවුලු ඉහලට ඉදි කරන තෙක් නිෂ්පාදන කටයුතු නතර කරන ලෙස දන්වන ලදි.

දුම් කවුලු පිළිබඳ ගැටලුව ආරම්භක අවස්ථාවන් හි දි සාකච්ඡා කර තිබූ බවත් නියම කරන ලද කොන්දේසිවලට අනුකූලව සමාගම විසින් දුම් කවුලු ඉදි කර තිබූ බවත් අලියා සමාගම පැමිණිලි කළේය. දුම් කවුලු නැවත ඉදි කිරීම සඳහා තමනට අරමුදල් නොමැති බව ද සමාගම තවදුරටත් කියා සිටියේය. සමාගම විසින් කලින් රැකියා විරහිතව සිටි ගමේ තරුණ පුද්ගලයන් 100 කට අධික සංඛ්‍යාවකට රැකියා ලබා දී ඇති බව ද එය පෙන්වා දෙයි.

සිය බලපත්‍රය අත්හිටුවීම අභියෝගයට ලක් කරමින් අලියා උලු සමාගම විසින් අධිකරණයේ නඩුවක් පවරා ඇත. ඔබ මෙම නඩුවේ විනිසුරුවරයා වේ. ඔබේ තීරණය ඉදිරිපත් කරන්න.

5. "*බුලන්කුලම එ. කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් හා තවත් අය* (2000) 3 ශ්‍රී. ල. නී. වා. 234 (එප්පාවල නඩුව) නඩුව වූකලී සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ අධිකරණ හා මහජන පාලනය වර්ධනය කරමින් වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කළ නඩු තීරණයකි"

එවැනි පාලනයකට ආධාර කිරීම සඳහා නීතිඥයන් හා විනිසුරුවරුන් භාවිත කළ උපක්‍රම පැහැදිලි කරමින් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

6. "ජාතික පරිසර පණතේ අඩංගු පාරිසරික බලපෑම් තක්සේරුවක අවශ්‍යතාව තිරසාර සංවර්ධනය සහතික කරලීම සඳහා උපකාරී නොවන්නේ එමගින් අවශ්‍ය කරනු ලබන්නේ පාරිසරික දෘෂ්ටි කෝණයකින් පමණක් ඇගැයීමට ලක් කෙරෙන විශේෂිත ව්‍යාපෘති

තක්සේරුවට ලක් කිරීම පමණක් වන හෙයිනි"

ඔබ මෙම ප්‍රකාශය සමග එකග වන්නෙහි ද? සංවර්ධනය මගින් සියලු ශ්‍රී ලාංකිකයන්ගේ අවශ්‍යතා සපුරාලන බව සහතික කරලීම පිණිස පාරිසරික බලපෑම් තක්සේරු නීති සංශෝධනය කිරීම හෝ පුළුල් කිරීම සඳහා ඔබ යෝජනා කරන සංශෝධන කවරේ ද

7. 'නුවර උද්‍යානය' වූකලී කොළඹ නගර මධ්‍යයෙහි මුහුදට මායිම්ව පිහිටා ඇති විවෘත පුළුල් බිම් තීරුවකි. බ්‍රිතාන්‍ය සමයේ සිට එය විනෝදාත්මක ප්‍රදේශයක් හා උද්‍යානයක් ලෙස ලෙස නගරයේ වැසියන් විසින් විශේෂයෙන් මුහුද අසළ විවෘත පරිසරයේ සතුටු වීමට කැමැත්තක් දැක් වූ කුඩා දරුවන් සිටින පවුල්වල සාමාජිකයන් හා වෙනත් අය විසින් භාවිත කරන ලදී. උද්‍යානය විවෘත එකක් වන අතර ඕනෑම අයෙකුට නොමිලේ ඇතුළු විය හැකිය. ආහාර වෙළඳුන් හා සෙල්ලම් බඩු, බැලුන් හා වෙනත් දෑ විකුණන්නන්හට ද සිය ව්‍යාපාරික කටයුතු නොමිලයේ එහි කරගෙන යාමට අවසර ඇත. උද්‍යානය තුළ දී ළමුන් හට අශ්වයන් පිට යාම හා වෙනත් සතුට දනවන ක්‍රියාවන්හි නිරත වීම කළ හැකිය.

උද්‍යානය වසර 50 කට අධික කාලයක් තිස්සේ කොළඹ නගර සභාවේ පාලනය යටතේ පැවති අතර පසුව නගර සංවර්ධන අධිකාරිය විසින් එය පවරාගෙන ඇත. උද්‍යානයේ පාලනය භාර නගර සංවර්ධන අධිකාරිය විසින් ළමුන් සඳහා ක්‍රීඩා භූමි පවත්වාගෙන යාමේ ව්‍යාපාරයෙහි නියැලී සිටින පුද්ගලික සමාගමක් වන සීමාසහිත ෆන් ඇන්ඩ් ගේම්ස් සමාගමට උද්‍යානය බදු දීමට තීරණයකොට ඇත. උද්‍යානය වටා වැටක් ඉදිකොට සිය විනෝදාත්මක උපකරණ එහි සිහිටුවමින් උද්‍යානය සංවර්ධනය කිරීමට සීමාසහිත ෆන් ඇන්ඩ් ගේම්ස් සමාගම අදහස් කරයි. උද්‍යානයේ කොටසක මහල් කිහිපයකින් යුත් රථ වාහන නැවතුම් පළක් ද ඉදි කිරීමට සමාගම අදහස් කරයි. ඉන්පසු සාමාන්‍ය මහජනතාවට උද්‍යානයට ඇතුළු වීම සඳහා මුදලක් ගෙවීමට සිදු වන අතර වීදි වෙළඳුන්ට හා විනෝදය සපයන වෙනත් අය ප්‍රදේශයෙන් බැහැර කෙරෙනු ඇත.

(අ) උද්‍යානය පුද්ගලික සමාගමකට බදු දීම මහජන යහපත උදෙසා අභියෝගයට ලක් කිරීමට නිහාල් හා නිෂානි අදහස් කරති

(ආ) උද්‍යානය තුළ තවදුරටත් ක්‍රියාකාරිවීමට අවසර නොලබන වෙළෙන්දෝ ද නව ව්‍යාපාරිය අභියෝගයට ලක් කිරීමට අදහස් කරති

ඔබ උගත් නීතිය සැලකිල්ලට ගනිමින් මේ සම්බන්ධයෙන් ඔවුනට ඉදිරිපත් කළ හැකි නෛතික තර්ක මොනවාදැ යි යන්න පිළිබඳව ඔවුනට උපදෙස් දෙන්න.

8. "ජාතික පරිසර පණතෙහි පරිසර දූෂණය පාලනය කිරීම පිළිබඳ විධිවිධාන සීමාසහිත වන අතර ඵලදායී නොවේ. පරිසර දූෂණය කරන කර්මාන්තවලින් පීඩාවට පත් වන අයට මහජන කරදරය පිළිබඳ නීති යටතේ මෙයට වඩා ඵලදායී ප්‍රතිකර්මයක් ලබා ගත හැකිය.

ඔබ මෙම ප්‍රකාශය සමග එකග වන්නෙහි ද? අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන විවේචනාත්මකව විග්‍රහ කරමින් හා නඩු තීරණ ඉදිරිපත් කරමින් සාකච්ඡා කරන්න.

හිමිකම් ඇවිරිණි

************